**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව 2013 වර්ෂය**
**--------------------------------------------------------**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

**--------------------------------------------------------**

2013 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

(අ) කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් පවත්වාගෙන යාම

(ආ) ජනතා තෘප්තිය ඉහළ නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මගින් කාර්යක්ෂම සේවා සැපයීමක් සහතික කිරීම.

(ඇ) ප්‍රතිඵලලාභීමුඛ ආකල්ප, වගකීම්, විචක්ෂණශීලී සම්පත් භාවිතය, අපක්ෂපාතිත්වය, විනිවිදභාවය ආදී සාර පද්ධතීන් රාජ්‍ය සේවය තුළ ස්ථාපිත කිරීම.

(ඈ) රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාළ ප්‍රතිපත්තිවලට අනුකූලවූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඉ) රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්තිවලට අනුකූලවූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඊ) දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මකවන විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරීන් මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ව්‍යාපෘති සංවිධානය කිරීම මූල්‍යමය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසු විපරම් කටයුතුවල සම්බන්ධීකාරකය ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.

(උ) දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ විවිධ වූ ආර්ථික, සමාජමය හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් ඔස්සේ ඉටුකර දීම.

(ඌ) දිස්ත්‍රික්කයේ රාජ්‍ය නියෝජිතයා වශයෙන් ක්‍රියා කරමින් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු රාජ්‍ය නොවන සංවිධානවලට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි හා නිශ්චිත තොරතුරු, ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් එක්රැස්කර ඒකාබද්ධ කර සපයාදීම.

(එ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ විවිධ දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ ඔවුන්ට හිමි ආදායම් එක්රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

(ඒ) ගංවතුර, සුළි සුළං, නියඟ, මුහුද ගොඩගැලීම් වැනි හදිසි ආපදා අවස්ථාවන්හිදී ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් සහ ආධාර ලබාදී ඔවුන්ගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම.

(ඔ) දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.

(ඕ) දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

(ක) විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

(ග) දිස්ත්‍රික් පරිපාලනයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් 16 දෙනා සමඟ කටයුතු මෙහෙයවීම.

(ච) දිස්ත්‍රික්කයේ ඵලදායිතාවය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඊට උනන්දු කිරීම.

(ජ) දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතනවල අරමුණු පරමාර්ථ හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.

(ට) සියළුම මැතිවරණ කටයුතුවලදී මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට කටයුතු කිරීම.

(ඩ) දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය නිලධාරීන්ගේ හැකියා වර්ධනයට සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.

(න) හදිසි ආපදාවලදී රජයේ නියෝජිතයා වශයෙන් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

(ය) විදේශ ආධාර ව්‍යාපෘති හා දේශීය අරමුදල් ව්‍යාපෘති සුපරීක්ෂණය හා අධීක්ෂණය මගින් වත්කම් කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) මාතර

(ආ) වැලිගම

(ඇ) කඹුරුපිටිය

(ඈ) හක්මණ

(ඉ) පස්ගොඩ

(ඊ) කොටපොල

(උ) මාලිම්බඩ

(ඌ) අකුරැස්ස

(එ) දික්වැල්ල

(ඒ) තිහගොඩ

(ඔ) මුලටියන

(ඕ) දෙවිනුවර

(ක) වැලිපිටිය

(ග) කිරින්ද පුහුල්වැල්ල

(ජ) පිටබැද්දර

(ට) අතුරලිය

## 1.3 විගණන විෂය පථය

--------------------------

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 29 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.15 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.910,726,406 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.909,731,765 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.994,641 ක් හෙවත් සියයට 0.11 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු | රු | රු | |
| පුනරාවර්තන | 813,040,606 | 812,176,453 | 864,153 | 0.11 |
| මූලධන | 97,685,800 | 97,555,312 | 130,488 | 0.13 |
| **එකතුව** | **910,726,406** | **909,731,765** | **994,641** | **0.11** |

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.2,348,397,528 ක්වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. එම ප්‍රතිපාදනවලින් අමාත්‍යාංශ 23 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් පිළිවෙලින් රු.803,874,088 ක් හා රු.1,441,648,439 ක් වශයෙන් එකතුව රු.2,245,522,527 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය පිළිවෙලින් රු.67,711,037 ක් හා රු.21,253,839 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 0.35 සිට සියයට 65.62 ක පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. අමාත්‍යාංශ 2 ක් විසින් සළසා තිබුණු එකතුව රු.1,597,685 ක මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් විසින් සළසා තිබුණු එකතුව රු.12,312,440 ක ප්‍රතිපාදනය රු.1,988,855 කින් ඉක්මවා රු.14,301,295 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර, අකුරැස්ස, දෙනියාය, වැලිගම හා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් මාර්ග 40 ක් කාපට් කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ලබා දී තිබුණි. දිස්ත්‍රික් ලේකම් විසින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ 2011 වර්ෂයේදී ගිවිසුම්වලට එළඹ තිබුණි. මේ සඳහා 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසාන වන විට රු.1,735,160,927 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ❖ මාර්ග 40 න් 25 ක් 2011 වර්ෂයේ දෙසැම්බර් වන විටද, ඉතිරි මාර්ග 2012 අප්‍රේල් හා දෙසැම්බර් වන විටද නිම කළ යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම වැඩ කටයුතු අවසන් කර නොතිබුණි.
- ❖ 2013 දෙසැම්බර් 31 දින වන විට කර්මාන්තවල දින දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වූ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කිසිදු ඉල්ලීමක් මාතර දිස්ත්‍රික් ලේකම් වෙත සිදුකර නොතිබුණි.
- ❖ කර්මාන්ත වෙනුවෙන් තාවකාලික ඇස්තමේන්තු 40 ක් පිළියෙල කර තිබුණු අතර, ඒ අනුව මුළු ඇස්තමේන්තු අගය වූ රු.1,042,390,189 ක් මත සියයට 20 ක අත්තිකාරම් වශයෙන් රු.208,478,037 ක් 2011 ජූලි 08 දින දකුණ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව එම අත්තිකාරම් වෙනුවෙන් සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.
- ❖ 2011 ජූනි 14 දින සිට 2011 ඔක්තෝබර් 19 දි දක්වා වූ කාලය තුළ මෙම කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ තිබුණි. එම ගිවිසුම් අනුව කොන්ත්‍රාත් වටිනාකම රු.2,918,515,317 ක් වී තිබුණි. එය තාවකාලික ඇස්තමේන්තුවල විටනාකම රු.1,876,125,128 කින් ඉක්මවා තිබුණි. මේ නිසා පිළියෙල කර තිබුණු පිරිවැය ඇස්තමේන්තුවල නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.
- ❖ උඩුපිල හන්දියේ සිට දෙව්සිරිගම හරහා කොකාවල හන්දිය දක්වා මාර්ගයේ දළ ඇස්තමේන්තුව රු.28,407,701 ක්වූ අතර ඒ සඳහා ගෙවිය යුතු නිවැරදි අත්තිකාරම් මුදල රු.5,681,544 ක් වුවත් අත්තිකාරම් වශයෙන් රු.9,898,898 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු.4,217,354 ක් වැඩිපුර අත්තිකාරම් ගෙවා තිබුණි.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දිවිනැගුම ජාතික වැඩසටහන යටතේ පළතුරු හා වෙනත් පැල ලබා ගැනීම සඳහා වූ ව්‍යාපෘතිය වෙනුවෙන් 2013 වර්ෂයේදී ලබාදි තිබුණු ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.13,333,980 ක් වැයකර තිබුණි. මේ සමබන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.
  - ❖ මෙම පැල මිළදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

- ❖ 2012 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මත සැපයුම්කරුගේ මිලට පැල මිළදී ගැනීමට ගිවිසගෙන තිබූ නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුමත මිලට පැල මිලදී ගැනීම නිසා රු.1,689,220 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.
- ❖ ප්‍රාථමික පාසල් සඳහා අවුරුදු නැකතට පැල සිටුවීමට උසස් වර්ගයේ පළතුරු පැල විවිධාංගිකරණයෙන් යුක්තව ලබාදිය යුතු වුවත් රු.1,019,690 ක් වටිනා මිටි ඇඹරැල්ල පැල 14,567 ක් පමණක් අදාළ ව්‍යාපෘතියට ලබාදීම නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

- දිවිනැගුම වැඩසටහන යටතේ පාසලක් සඳහා 2013 වර්ෂයේදී රු.89,500 ක් වටිනා පැල වර්ග 12 ක් යටතේ පැල 549 ක් ලබා දී තිබුණි. 2014 මැයි 28 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි ලබාදී තිබූ පැලවලින්, පැල 64 ක් නැවත ආපසු භාරදී තිබුණි. එසේ ඒවා භාරගත් පාර්ශවය අනාවරණය වී නොතිබුණි. ඉතිරි පැල 485 ක් පාසලට ලබාදුන් බව පැවසුවද භෞතික පරීක්ෂාවේදී පැල 53 ක් පමණක් දක්නට ලැබුණි. ඒ අනුව රු.51,980 ක් වටිනා පැල 432 ක හිඟයක් අනාවරණය විය.
- අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2013 වර්ෂයේ කිතුල් බීම නිෂ්පාදනය සඳහා රු.150,000 ක් ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.142,590 ක් කිතුල් බීම නිෂ්පාදනය සඳහා උපකරණ මිලදී ගැනීමට සහ ඉතිරිය පුහුණු වැඩමුළු සඳහා වැයකර තිබුණි. 2014 ජුනි 20 සිදු කළ විගණන පරීක්ෂාවේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බවත් අදාළ සමිතියේ සභාපති භාරයේ එම උපකරණ නොතිබුණු බවත් අනාවරණය විය. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වැය කළ රු.142,590 ක මුදල නිෂ්ඵල වී තිබුණි.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රියදුරු පුහුණුව හා බලපත්‍ර ලබාදීම සඳහා 2013 වර්ෂය තුළදී රියදුරු පුහුණු පාසලකට අවස්ථා දෙකකදී රු.1,577,800 ක් ගෙවා තිබුණි. එක් පුද්ගලයෙකු පුහුණු කිරීම සඳහා රු.9,800 ක් බැගින් පුද්ගලයින් 161 දෙනෙකු සඳහා මෙම වියදම කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ❖ පුහුණු කිරිම සඳහා මුදල් වැය කළ පුද්ගලයින් 161 දෙනාගෙන් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය 107 දෙනෙක් පමණක් සමත්වී තිබුණි. ප්‍රායෝගික පරික්ෂණයෙන් 4 දෙනෙක් අසමත්වී තිබුණි. 49 දෙනෙක් ප්‍රායෝගික පරික්ෂණය සඳහා ඉදිරිපත්වී නොතිබුණි. වයස අවුරුදු 56 ක් වූ අයෙකු මිය ගොස් තිබුණි.
- ❖ මෙම ව්‍යාපෘතියේ අරමුණ රැකියා විරහිත තරුණ තරුණියන් පුහුණු කිරිම වුවද, අවුරුදු 40 ට වැඩි පුහුණුලාභීන් 25 දෙනෙකු වෙනුවෙන් රු.(25 X 9,800 ) 245,000 ක් වැය කර තිබුණි. එම පුහුණුලාභීන් 25 දෙනාගෙන් 15 දෙනෙකුට පමණක් බලපත්‍රය ලබාගැනීමට හැකි වී තිබුණි.
- ❖ සියළුම ප්‍රතිලාභීන් පුහුණුව ලබා රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසු ගෙවීම් කළ යුතු වුවද, 81 දෙනෙකු සඳහා පමණක් එසේ කර තිබුණි.
- ❖ මේ අනුව 161 දෙනෙකු වෙනුවෙන් ගෙවීම් කර තිබුණත්, ප්‍රතිඵල අත්කර ගැනීමට 107 දෙනෙකුට පමණක් හැකි වි තිබුණි.

- පෙර පාසල් දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ ජාතික වැඩසටහන සඳහා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් 2013 වර්ෂයේදී දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් රු.269,200 ක් ප්‍රතිපාදන ලබාදී තිබුණි. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පෙර පාසල් 63 ක් පැවැති අතර එහි ළමුන් සංඛ්‍යාව 1,630 ක් වී තිබුණි. ඉන් පෙර පාසල් 11 ක ළමුන් 247 ක් වෙනුවෙන් කිරි වීදුරුව වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දින වන විට සළසා දි තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු රු.123,381 ක් හෙවත් සියයට 46 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.
- වැලිගම පොල්කොළ මැලවීමේ රෝගයට පාත්‍රවූ ඉඩම්වල පළතුරු වැවීමේ ව්‍යාපෘතිය යටතේ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා 2013 වර්ෂය තුළ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු.6,640,000 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදී තිබුණි. මෙයින් අන්නාසි, කෙසෙල්, ගම්මිරිස්, ගස්ලබු, ඩ්‍රැගන් ෆෘට් හා වෙනත් පළතුරු පැල මිළදී ගැනීම වෙනුවෙන් රු.5,620,000 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.
  - ❖ මෙම සියළු පැල මිලදී ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අභිමතය පරිදි පැල මිළදීගෙන තිබුණි.

- ❖ මෙම ව්‍යාපෘතිය සඳහා කෙසෙල් පැල මිලදී ගැනීමේදී කෙසෙල් පැල 2,000 ක් සඳහා ගොවි සංවිධාන තුනකින් මිල ගණන් කැඳවා එක් සැපයුම්කරුවෙකුගෙන් පැල 3,650 ක් මිලදී ගෙන තිබුණි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුමත මිලට වඩා වැඩි මිලකට මිලදී ගැනීම නිසා රු.25,750 ක් වැඩිපුර ගෙවා තිබුණි.
- ❖ ඉහත සඳහන් පරිදි ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර අන්නාසි පැල ලක්ෂයක් පැලයක් රු.14 බැගින් රු.1,400,000 කට මිලදී ගෙන තිබුණි. 2013 ජූලි 03 දිනැති ලිපිය මගින් අදාළ සැපයුම්කරු පැලයක් රු.12 බැගින් සපයන බව සඳහන් කර තිබුණි. එම ලිපියේ සඳහන් මිල ගණන් කෙරෙහි අවධානය යොමු නොකර 2013 අගෝස්තු 13 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි පැලයක් රු.14 බැගින් මිලදි ගැනිම නිසා රු.200,000 ක මූල්‍යමය පාඩුවක් රජයට සිදුවී තිබුණි.
- ❖ අන්නාසි පැල සැපයූ තවාන්කරු වෙත රු.126,600 ක් වටිනා අන්නාසි පැල 5,000 ක් හා වෙනත් වර්ගවල පළතුරු පැල 645 ක් නිකුත් කර තිබුණි.
- ❖ ගෙවීම් වවුචරයට අමුණා තිබූ බෙදුම් ලැයිස්තු අනුව පැල ලබාදුන් බව දක්වා තිබුණද, රු.317,050 ක් වටිනා පැල 9,975 ක් අදාළ පුද්ගලයින්ට ලැබී නොතිබුණු බව අනාවරණය විය.
- ❖ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන්ට රු.481,360 ක් වටිනා ගම්මිරිස් පැල 30,085 ක් බෙදාදී තිබූ අතර පැල බෙදාදීමේ ලැයිස්තුවේ අදාළ විස්තර නොතිබුණි.
- ❖ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන්ට ගම්මිරිස් පැල සඳහා වූ බෙදුම් ලැයිස්තුවේ පැල 1000 ක් බෙදා තිබූ බවට එකම නම දෙවරක් ව්‍යාජ ලෙස සඳහන් කර තිබූ අතර එසේ නිකුත් කළ ගම්මිරිස් පැලවල වටිනාකම රු.16,000 ක්වී තිබුණි.
- ❖ මෙම ව්‍යාපෘතිය යටතේ රු.70 බැගින් රෙඩ්ලේඩි වර්ගයේ ගස්ලබු පැල 6,325 ක් රු.442,750 ක් ගෙවා ලබාගෙන තිබුණි. මෙම පැල බෙදාහැරීම පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක, සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.
- ❖ බෙදුම් ලේඛනයේ සඳහන් පැල අදාළ ප්‍රතිලාභීන්ට ලැබී නොතිබුණ බව තහවුරු විය. නියැදිය අනුව ප්‍රතිලාභීන් 05 දෙනෙකුට පැල 2,400 ක් ලැබී නොතිබුණ බව තහවුරු වූ අතර එහි වටිනාකම රු.168,000 ක් විය. මේ

පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පැල බෙදාදීමේ ලේඛනය අනුව ප්‍රතිලාභීන් 05 දෙනෙකුට රු.168,000 ක් වටිනා පැල 2,400 ක් ලබාදී තිබුණත්, අදාළ ප්‍රතිලාභීන් විසින් එම පැල ලබාගත් බවට තහවුරු කර නොතිබුණි.
- වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දෙනිපිටිය කොට්ඨාශයේ එක් පුද්ගලයෙකුට දොඩම් පැල 250 ක් හා ඩ්‍රැගන් ෆෘට් පැල 200 ක් ලබාදී තිබුණි. ඉන් දොඩම් පැල 150 ක් පමණ ක්ෂේත්‍රයේ සිටුවා තිබුණි. අනෙකුත් පැල එක තැනක ගොඩ ගසා තිබූ අතර එහි වටිනාකම රු.84,000 ක් විය.
- කඹුරුපිටියේ පුද්ගලයෙකු වෙත රු.70,000 ක් වටිනා ගස්ලබු පැල 1,000 ක් බෙදාදී තිබූ බවට බෙදුම් ලේඛනයේ සඳහන් විය. ඉන් පැල 300 ක් පමණක් ක්ෂේත්‍රයේ සිටුවා ඉතිරි පැල 700 සිටුවීමකින් තොරව ගොඩගසා තිබුණි.

❖ මෙම ව්‍යාපෘතිය යටතේ අරමුණෙන් බැහැර කාර්යයන් සඳහා රු.98,572 ක් වැය කර තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 26201 | 53,000,000 | 43,142,334 | 36,000,000 | 41,904,230 | 200,000,000 | 177,283,079 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 26201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව

රු.1,584,731 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ණය ලබාදීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර එකතුව රු.1,395,592 ක ණය ලබාදී තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0038/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.336,839,432 ක් විය. දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වර්ෂ 02 ඉක්මවූ රු.577,860 ක තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 න් කාර්යාල 08 ක අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

කාර්යාලයේ වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 03 ක් නිෂ්ක්‍රීයව පැවැතුණි. එම වාහන තුනෙහි වටිනාකම කිසිදු ලේඛනයක ඇතුළත් කර නොතිබුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්තාව 2014 අගෝස්තු 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුණේ 2012 වර්ෂය වෙනුවෙනි.

(ii) 2013 වර්ෂයට අදාළ මාතර පීක්වැල්ල සංචාරක නිවාසයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වාදී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 1.8 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| XIX වන පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය | 12,742 | රජයේ නිවාසයක පදිංචිය වෙනුවෙන් මාස 06 ක කාලය සඳහා කුලී අයකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 103, 104 හා 109 | 103,213 | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කැබ්රථයක් අනතුරට ලක්වීමෙන් සිදුවූ රු.103,213 ක පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645(අ) හා 1646 | 7,221,310 | වාහන 41 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

නිල්වැල්ල කෙමගොඩ හරහා දොඩම්පහල දක්වා මාර්ගයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.64,864,902 ක්වූ අතර වැඩ ආරම්භ කළ යුතු දිනය 2011 ජුනි 14 විය. වැඩ නිමකළ යුතු දිනය 2011 නොවැම්බර් 10 වුවත්, කර්මාන්තයේ වැඩ කටයුතු 2013 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. එදිනට කර්මාන්තයේ වියදම රු.14,885,327 ක් වී තිබුණි.

**(ආ) මාතර බස් නැවතුම්පලේ පල්දෝරු පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

මාතර මහා නගර සභාවේ අධීක්ෂණය මත ඉදිකර තිබූ මාතර බස් නැවතුම්පලේ පල්දෝරු පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන සළසා තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් රු.3,675,377 ක ඇස්තමේන්තුවක් සකසා තිබූ අතර ඒ සඳහා 2011 දෙසැම්බර් 31 දින සම්පූර්ණ මුදලම මාතර මහා නගර සභාව වෙත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිදහස් කර තිබුණි. මේ සඳහා උපදේශන ගාස්තු ලෙස රු.116,046 ක්ද ගෙවා තිබුණි. 2013 ජුනි 28 දින සිදුකළ භෞතික පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පල්දෝරු පද්ධතිය සඳහා ඉදිරිපත් කර තිබූ සැලැස්මේ සඳහන් ඉදිකිරීමට යෝජිත බස් නැවතුම්පලේ වැසිකිළිවලින් පිටවන අපද්‍රව්‍ය, ඍජුව ගලාඒමක් නොතිබුණි. ඉදිකිරීමේදී සභාවේ පැරණි රවුම් ටැංකිය හරහා එම වලට අපද්‍රව්‍ය එකතුවීමට සලස්වා තිබුණි. එම ටැංකියට එකතු වන අපද්‍රව්‍ය ටැංකිය හරහා පිරිසිදු කර ඉතිරිවන ජලය, 1986 මාර්තු 10 දිනැති අංක 392/6 දරන ගැසට් පත්‍ර යේ පලවූ දැන්වීමේ 62 වන වගන්තියේ නියමයන්ට පටහැනිව ප්‍රධාන මාර්ගයේ කානුවකට සම්බන්ධ කර තිබුණි. මෙම අපවිත්‍ර ජලයෙන් දුර්ගන්ධයක්ද පිටවිය. එම කානුවද කැඩී තිබුණි.

(ii) නගර සභාව වෙත නිදහස් කළ මුදලින් රු.2,061,097 ක් නගර සභාව, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ අතර අදාළ කර්මාන්තය නිසි ලෙස ඉටු නොවීම තුළ ඉහත මුදල හා රු.116,046 ක උපදේශන ගාස්තු මගින් නිසි ප්‍රයෝජනයක් ලබා නොතිබුණි.

(ඇ) **මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති**

-----------------------------------

මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ දික්වැල්ල හන්දියේ සිට මුස්ලිම් වීදිය හරහා වැවුරුකන්නල පන්සල දක්වා මාර්ගය කාපට් කිරීම සඳහා 2011 ජූලි 08 දින අත්තිකාරම් රු.3,600,000 ක්ද, 2011 දෙසැම්බර් 13 දින එකතු කළ අගය මත බදු රු.432,000 ක්ද වශයෙන් එකතුව රු.4,032,000 ක් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අංශය වෙත ගෙවා තිබුණි. කර්මාන්තයේ කාලසීමාව මාස 05 ක් ලෙස දක්වා තිබූ අතර 2013 ඔක්තෝබර් මස 31 විගණන දිනය වනවිට අත්තිකාරම් මුදල් ගෙවා අවුරුදු 2 යි මාස 3 ක්ද වැට් බදු ගෙවා අවුරුදු 1 යි මාස 10 ක්ද ඉක්මවූ පසු පළාත් සංවර්ධන අතිරේක ලේකම්ගේ අංක MED/RD/PRDP/MT/01 ලිපිය පරිදි 2012 ජුනි 05 දින ඉහත මාර්ගය ඉදිකිරීම අවලංගු කර ඒ වෙනුවට වේළුවනාරාම මාර්ගය වෛහැල්ල දක්වා වැඩිදියුණු කිරිමට යෝජනා කර තිබුණි.

## 1.10 කාර්යසාධනය

-----------------

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

2010 ජුනි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත රු.194,000,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවකට පවරා තිබුණි. කර්මාන්තය 2012 මැයි 06 දින වන විට වැඩ අවසන් කර භාරදිය යුතු විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාළ ගොඩනැගිල්ල ඉදිකර භාරදීම, 2014 ජුනි 20 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) එකඟතා ගිවිසුම අනුව ප්‍රමාද ගාස්තු ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 0.05 ක් අයකළ යුතු වුවද, 2014 ජුනි 20 දින වනවිටද එම මුදල වූ රු.76,048,000 ක් ප්‍රමාද ගාස්තු ලෙස අයකර නොතිබුණි.

(ඇ) උපදේශක ගාස්තු ලෙස ගිවිසුම්ගත රු.9,787,404 ක මුදලින් රු.8,609,011 ක් ගෙවා තිබූ අතර ගිවිසුම් පරිදි උපදේශන කටයුතු නිසි ලෙස ලැබී නොතිබුණි.

(ඈ) 2014 ජුනි 20 දින කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.2,779,435 ක අමතර ඇස්තමේන්තුව සමඟ කොන්ත්‍රාත් වටිනාකම රු.196,779,435 ක් වී තිබුණි. අමතර ඇස්තමේන්තුව පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබුණි.

(ඉ) 2014 ජුනි 20 දින වන විට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම නිසා වූ මිල වෙනස්වීම මත රු.8,103,632 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඊ) අදාළ කර්මාන්තය 2012 මැයි 06 දිනට ප්‍රථම ඉදිකර අවසන් නොකිරිම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනට කුලියට ගෙන තිබුණු ගොඩනැගිල්ල පවත්වා තිබුණි. මේ නිසා මසකට රු.200,000 බැගින් රු.5,400,000 ක අපේක්ෂා නොකළ කුලියක් ගෙවීමට සිදු වී තිබුණි.

(උ) 2014 ජුනි 17 දින සිදු කළ භෞතික පරීක්ෂාව අනුව කර්මාන්තයේ අංක: 4.05 හා 4.06 හි සඳහන් පරිදි අභ්‍යන්තර මාර්ගවල වැඩකොටස් ඉටු කර නොතිබීම, පොළවට අල්ලා තිබූ ටයිල් නියමිත ප්‍රමිතියට අනුකූල නොවීම, විදුලි පංකාවල කප් කොන්ක්‍රීට් තට්ටුවට නිවැරදිව සවි නොකිරීම, ප්‍රධාන දොර අසල ටයිල් සීරීම වැනි අඩුපාඩු අනාවරණය විය. ඊට අමතරව ගොඩනැගිල්ල සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයා විසින් ගොඩනැගිල්ලේ අඩුපාඩු 68 ක් සහිත නිරීක්ෂණ වාර්තාවක් ද ඉදිරිපත් කර තිබුණි.

## 1.11 අවිධිමත් ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා රු.110,214 ක්ද, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියාවට රු.463,140 ක්ද වශයෙන් රු.573,354 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙම යන්ත්‍රය වර්ෂය තුළ එකම අවස්ථාවක හෝ සේවා කර නොතිබුණු අතර එසේ සිදු කළේ නම් මෙම අළුත්වැඩියා වියදම අඩුකර ගැනීමට හැකියාව තිබුණි. අළුත්වැඩියාව සම්බන්ධව ලිඛිත ගිවිසුමකටද එළඹ නොතිබුණි.

(ii) 2013 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.4,505,625 ක මිලදී ගැනීම් සිදු කර තිබුණි. මිල ගණන් කැඳවූ අවස්ථාවේදී මිලදී ගන්නා භාණ්ඩවල පිරිවිතර ඉදිරිපත් කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවේ මිලදී ගන්නා භාණ්ඩ පිළිබඳ දැණුමක් ඇති සාමාජිකයෙකු පත් කර නොතිබුණු අතර, එම මිලදී ගැනීම් සඳහා තාක්ෂණ ඇගැයීම් කමිටුවක් පත්කර එහි නිර්දේශ ලබා ගත් බවට තොරතුරුද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 මැයි 25 සහ 26 දිනවල පවත්වන ලද වෙසක් පෙරහැර වෙනුවෙන් විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන 10 කින් පරිත්‍යාග ලෙස ලද රු.815,000 ක් පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- පෙරහැර 2013 මැයි 25 සහ 26 දිනවලින් අවසන්වී තිබුණද 2013 මැයි 23 සිට සැප්තැම්බර් 06 දින දක්වා පරිත්‍යාග ලබාගෙන තිබුණි.
- මුදල් රෙගුලාසි 170(2) ප්‍රකාරව මෙම පරිත්‍යාග සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවත්, එසේ නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නොවූ මෙම කාර්යය වෙනුවෙන් මුදල් පරිත්‍යාගයන් ලබාගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඒ මගින් පෙරහැර සඳහා රු.819,638 ක් වැයකර තිබුණි.

## 1.12 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරික්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) නිල නිවාස සම්බන්ධ ඉන්වෙන්ට්‍රි ලේඛන පැවැත්වීම ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 8.1 හා 8.3 වගන්ති හා එකඟ නොවුණි. 2012 ඔක්තෝබර් දක්වා පාවිච්චි කළ නිල නිවාස 2 ක් ඉවත්කර තිබූ අතර ඒ පිළිබඳ දිස්ත්‍රික් ලේකම් දැනුවත්කර නොතිබුණි. නිල නිවාස 5 ක් පාවිච්චියෙන් තොරව නිෂ්ක්‍රීයව පැවති අතර ඉන් 3 ක් ගරාවැටී තිබුණි. මෙම නිවාස අළුත්වැඩියා කර රජයේ සේවකයින්ට ලබාදීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි. එසේම රජයේ නිල නිවාස සඳහා කුලී අයකිරීම් සම්බන්ධව ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ත්‍රිරෝද රථය අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් 2012 මැයි 08 දින ලැබී තිබුණි. ත්‍රිරෝද රථය 2013 වර්ෂයේ අප්‍රේල් මස අවසානය දක්වා සාමාන්‍ය පරිදි ධාවනය වී තිබූ අතර සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල දින 2 බැගින් අවසන් වරට ධාවනය කර තිබුණි. එදිනෙන් පසු එම රථය ප්‍රයෝජනයට නොගෙන තිබීමෙන් දිරාපත්වීමට ඉඩහැර ඇති අතර කාර්යාලයට අනවශ්‍ය නම් අදාළ පාර්ශවයන්ට යොමු කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුවූ වාහන අනතුරු 19 කින් 05 ක අලාභයන් 2014 අගෝස්තු 31 දින දක්වා ගණනය කර නොතිබුණි. ඉතිරි අනතුරු 14 හි අලාභහානිය රු.1,141,194 ක් ලෙස ගණනය කර තිබුණු අතර එම මුළු අනතුරුවලින් සිදු වූ අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයේ අනතුරට ලක්වී තිබූ රු.5,600,000 ක් වටිනා ටොයෝටා හයිලක්ස් වර්ගයේ කැබ්රථය 2011 දෙසැම්බර් 25 දින අනතුරට ලක්වී තිබුණි. එම අනතුරෙන් රු.1,817,098 ක් ලෙස අලාභහානිය ගණනය කර තිබුණි. එම අලාභයෙන් රක්ෂණ සංස්ථාවෙන් රු.1,600,046 ක් ලැබී තිබූ අතර අමතර කොටස් සඳහා වට්ටම් ලෙස රු.113,839 ක් අළුත්වැඩියා වියදමෙන් අඩුකර තිබුණි. ඒ අනුව රජයට රු.103,213 ක තවදුරටත් අයකර ගත යුතු අලාභයක් සිදුවී තිබුණත්, එම අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර අය කර ගැනීමට හෝ කපා හැරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 1.13 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද අතුරින් පසු විපරම් කටයුතු නිම නොකළ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | | යොමුගත විෂයය |
|---|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | | |
| 2012 | 4-1 (ඇ) (105) ශීර්ෂ (vii) | - | දිවිනැගුම වැඩසටහන යටතේ පැල මිලදී ගෙන බෙදා හැරීම. |
| 2012 | 5 - 1 (ආ) | - | පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය |

## 1.14 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බඹරැන්ද දකුණ මාර/1859 අංකය දරන ක්ෂේත්‍ර පත්‍රයට අයත් බංගලාවත්ත නැමැති ඉඩම් කැබැල්ල පුද්ගලික සමාගමකට දීමනා පත්‍රයකින් 2007 ජනවාරි 18 දින සිට ලබාදී තිබුණි. මෙම ඉඩම ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් විසින් 2007 පෙබරවාරි 05 දිනැති ලිපියක් මගින් හා එම දිමනා පත්‍රයේ මුල් පිටපත් හා අනුපිටපත් දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කරමින් දන්වා තිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම ඉඩම ලියාපදිංචි කිරිමට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. මෙම බදුකරුගෙන් අදාළ බදු මුදල් 2014 අප්‍රේල් 30 දින වන විටත් අය කර නොතිබුණු අතර ඒ පිළිබඳ කිසිදු තොරතුරක් ප්‍රාදේශීය ලේකම් විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මියගිය විශ්‍රාමිකයින්ගේ විස්තර මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කඩිනමින් ගෙන්වා ගැනීමට ක්‍රමවේදයක් නොතිබීමෙන් 2013 වර්ෂයේ විශ්‍රාම වැටුප් ලෙස මිය ගිය විශ්‍රාමිකයන්ගේ නමින් ගෙවා තිබුණු රු.2,056,310 ක් නැවත අයකර ගෙන තිබුණි. මේ සඳහා නිසි ක්‍රමවේදයක් නොතිබීම නිසා රජයේ මුදල් අනවශ්‍ය ලෙස වෙනත් පාර්ශවයන් භාරයේ පැවැතිමට ඉඩකඩ සළසා තිබුණි.

(ඇ) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස සංකීර්ණයේ නිවසක් සඳහා 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් රු.12,742 ක මුදලක් අය නොවී පැවතුණි. එමෙන්ම මෙම රජයේ නිවාසවල කුලී අයකිරීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබූ අතර කලත්‍රයා රජයේ සේවකයෙක් නම් කලත්‍රයාගෙන් අයවිය යුතු කුලිය ගෙන්වා ගැනීමක්ද සිදුකර නොතිබුණි. ඒ අනුව කලත්‍රයාගේ කොටස අයවී නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය භාරයේ ඇති බාල වයස්කරුවන්ගේ ගිණුම් නියමිත කාලය සම්පූර්ණ වූ විට ඔවුන්ට ලබාදීමට කටයුතු කළයුතු වුවත්, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2006, 2007, 2010, 2011 හා 2013 වර්ෂවලදී වයස සම්පූර්ණවූ බාලවයස්කාර ගිණුම් 4 ක් අදාළ පුද්ගලයින්ට භාරදී නොතිබුණි.

## 1.15 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 07 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 03 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 79 | 91 | - | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 16 | - | 02 |
| | එකතුව | 103 | 117 | 01 | 15 |

(ආ) නිෂ්කාර්ය මානව සම්පත්

මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උපාධිධාරීන් 117 දෙනෙක් සඳහා කිසිදු රාජකාරියක් පැවරීමකින් තොරව 2013 වර්ෂය තුළ වැටුප් ලෙස රු.16,686,240 ක මුදලක් ගෙවා තිබුණි.